අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்லை, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112784846
isurupaya@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. } ED/09/02/04/08/04- 11 ඔබේ යොමුව / உமது இல. / Your Ref. } දිනය / திகதி / Date } 2024.01. 05

චක්‍රලේඛ අංකය - 44/2023

සියලු ම විදුහල්පතිවරුන් වෙත

**<u>පාසල් මාර්ග ආරක්ෂාව පිළිබඳ වැඩසටහන</u>**

**<u>මාර්ග ආරක්ෂණ සමාජ (Road Safety Club) පාසල් මට්ටමින් පිහිටුවීම</u>**

මෙරට මාර්ග අනතුරු හේතුවෙන් වාර්ෂික ව මිය යන සහ ආබාධිත තත්ත්වයට පත් වන පුද්ගලයන්ගේ සංඛ්‍යාව දිනෙන් දින ඉහළ යැමත් එම පිරිස අතර සිටින දෙමාපියන්ගේ හා දරුවන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු තරම් ඉහළ අගයක් ගැනීමත් නිසා, එම අයහපත් තත්ත්වය මෙරට ශ්‍රම බලකායට සහ අධ්‍යාපන ක්ෂේත්‍රයට සෘජු ව ම ඉතා අහිතකර අන්දමින් බලපාන බැවින් එම අනතුරු වළක්වා ගැනීම හා පාලනය කර ගැනීම කෙරෙහි අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අවධානය යොමු කර ඇත.

මාර්ග නීති රීති පිළිබඳ ව දක්වන නොසැලකිල්ල හා අපරීක්ෂාකාරී රිය ධාවනය මෙරට මාර්ග අනතුරුවලට ප්‍රධාන ම හේතුව ලෙස හඳුනාගෙන ඇති අතර, එයට විසඳුම් සෙවීමේ දී කෙටිකාලීන, මධ්‍යකාලීන හා දීර්ඝකාලීන වශයෙන් සැලසුම් සහගත වැඩසටහනක අවශ්‍යතාව ඉස්මතු වෙයි.

මෙරට මාර්ග අනතුරු වැළැක්වීමේ ජාතික ආයතනය වශයෙන් ක්‍රියා කරනු ලබන මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මේ සම්බන්ධයෙන් අවධානය යොමු කර පුළුල් වැඩපිළිවෙලක් සකස් කර ඇති අතර ඊට සමගාමී ව අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒකාබද්ධ ව ක්‍රියාත්මක කළ හැකි වැඩසටහනක් ද සැලසුම් කර ඇත. එමගින් අනාගත පුරවැසියන් වශයෙන් සමාජයට පිවිසෙන වත්මන් පාසල් සිසුන්ට මාර්ග ආරක්ෂාව පිළිබඳ ව නිසි දැනුමක් ප්‍රායෝගික අත්දැකීම් සමඟ ලබා දීමට ක්‍රියා කෙරේ. ශිෂ්‍ය ප්‍රජාවට මග පෙන්වන ගුරුවරුන් මෙන් ම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ශික්ෂණලාභීන් දැනුම්වත් කරමින් සවිබල ගැන්වීමේ වැඩසටහනක් ද මේ සමඟ දියත් කරනු ලබයි.

ඒ අනුව පාසල් සිසුන්ගේ මාර්ග ආරක්ෂාව තහවුරු කිරීම සඳහා පුළුල් ශිෂ්‍ය සහභාගීත්වයක් සහිත ව පාසල් මට්ටමින් **'මාර්ග ආරක්ෂණ සමාජ'** (Road Safety Clubs) පිහිටුවා මාර්ග ආරක්ෂාව පිළිබඳ දැනුම මෙන් ම එය සම්බන්ධයෙන් උපායමාර්ගික අත්දැකීම් ලබා දීමත් සිදු කෙරෙනු ඇත. **'මාර්ග ආරක්ෂණ සමාජ'** (Road Safety Clubs) පිහිටුවීම පිළිබඳ ව නිකුත් කරනු ලබන මෙම චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාර ව අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් මාර්ග පරිහරණයේ දී පාසල් සිසුන්ගේ සුරක්ෂිතතාව තහවුරු කිරීම, මෙහි දී රේඛීය කළමනාකරු වශයෙන් විදුහල්පතිවරයා සතු ප්‍රධාන වගකීම බවට පත් වෙයි.

මේ මඟින්, දැනට පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වන 'මාර්ග ආරක්ෂණ ඒකක'/' රිය නියාමක ඒකක' මඟින් මාර්ග ආරක්ෂාවට අදාළ ව කරන ක්‍රියාකාරකම්වල කිසිදු වෙනසක් සිදු නොවේ. මෙම කාර්යයන් වඩාත් සංවිධානාත්මක ව ක්‍රියාවට නැංවීම සඳහා පහත සඳහන් මග පෙන්වීම කෙරෙහි අවධානය යොමු කරවමි.

1. දැනට පාසල්වල ක්‍රියාත්මක මාර්ග ආරක්ෂණ ඒකක/ රිය නියාමක ඒකක මින් ඉදිරියට හඳුන්වනු ලබන්නේ 'මාර්ග ආරක්ෂණ සමාජය' ('Road Safety Club') ලෙස ය.
2. කිසියම් පාසලක මාර්ග ආරක්ෂණ ඒකකයක් ක්‍රියාත්මක නොවේ නම්, නව 'මාර්ග ආරක්ෂණ සමාජයක් ' මෙම චක්‍රලේඛයේ උපදෙස් පරිදි පිහිටුවා ගත යුතු ය.

3. මාර්ග ආරක්ෂණ වැඩසටහන් සහ රිය නියාමනය කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීම සඳහා පිහිටුවා ගනු ලැබූ මාර්ග ආරක්ෂණ සමාජයේ සංවිධාන ව්‍යුහය පහත පරිදි විය යුතු ය.

4. යෝජිත පාසල් මාර්ග ආරක්ෂණ සමාජයේ සංවිධාන ව්‍යුහය

❖ අනුශාසක
  - විදුහල්පති

❖ උපදේශක මණ්ඩලය
  - නියෝජ්‍ය විදුහල්පති හෝ සහකාර විදුහල්පති
  - මාර්ග ආරක්ෂණ සමාජය භාර ගුරුභවතා
  - ප්‍රදේශයේ පොලිස් රථවාහන අංශයේ ස්ථානාධිපති
  - මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ නියෝජිතයෙක්
  - මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරුවරයකු

❖ ශිෂ්‍ය කමිටුව
  - සභාපති
  - ලේකම්
  - උපසභාපති
  - උපලේකම්
  - භාණ්ඩාගාරික
  - කාරක සභා කමිටු සාමාජිකයන් සංඛ්‍යාව 8කි. (6 ශ්‍රේණියේ සිට සෑම ශ්‍රේණියකින් ම එක් සිසු/ සිසුවියක් බැගින් වන සේ තෝරා ගත යුතුයි.)

5. මාර්ග ආරක්ෂණ සමාජයේ සාමාජිකත්වය ලබා ගැනීමට 3 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා සෑම සිසු/ සිසුවියකට ම මෙම අවස්ථාව හිමි වේ.

6. මාර්ග ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී මාර්ගයේ රිය නියාමක කටයුතු සඳහා 8 ශ්‍රේණියෙන් ඉහළ සිසුන් පමණක් සම්බන්ධ කර ගත යුතු ය.

7. මාර්ග ආරක්ෂණ සමාජයේ (Road Safety Club) සතු වගකීම පහත පරිදි වේ.

7.1. මාර්ග ආරක්ෂණ ක්‍රියාවලිය අරමුණු කරගෙන ජාතික මාර්ග ආරක්ෂණ සභාවේ ප්‍රතිපත්තියට අනුකූල ව වැඩසටහන් සංවිධානය කිරීම.

7.2. මාර්ග ආරක්ෂණය සහ රිය නියාමක කටයුතු පිළිබඳ පාසලේ සමස්ත ශිෂ්‍ය ප්‍රජාව දැනුම්වත් කිරීම.

7.3. පාසල් ප්‍රජාව (ආදිශිෂ්‍ය, දෙමාපියන්, සුබපතන්නන්, අසල්වාසී විවිධ සංවිධාන) මාර්ග ආරක්ෂණ කටයුතු සඳහා සහය ලබා ගැනීම.

7.4. රිය නියාමන කාර්යයේ යෙදෙන සාමාජිකයන් පුහුණු කිරීම හා සවිබල ගැන්වීම.

7.5. මාර්ග ආරක්ෂණය සම්බන්ධයෙන් කටයුතු කරන ජාතික ආයතන මගින් සංවිධානය කරනු ලබන පුහුණු වැඩසටහන්, වැඩමුළු, සම්මන්ත්‍රණ හා විවිධ වැඩසටහන්වලට සහභාගී වීම.

7.6. පාසලේ රිය නියාමක කටයුතු සුපරීක්ෂණය සහ මාර්ගෝපදේශ සැපයීම.

7.7. පාසල් මාර්ග ආරක්ෂණ සමාජයේ, සාමාජිකයින්ට අවශ්‍ය උපකරණ, පළඳනා සහ අවශ්‍ය සේවා සැපයීමට කටයුතු කිරීම.

7.8. පාසල් මාර්ග ආරක්ෂණ සමාජයට අදාළ තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාම.

7.9. පාසල් මාර්ග ආරක්ෂණ සමාජය සඳහා (Road Safety Club) අනුග්‍රාහකයින් හඳුනාගනිමින් ඔවුන්ගේ සහය ලබා ගැනීම.

7.10. වාර්ෂික ව පැවැත්වෙන 'ගෝලීය මාර්ග ආරක්ෂණ සතියට' සමගාමීව අවට පාසල් සම්බන්ධ කර ගනිමින් ඒකාබද්ධ වැඩසටහන් ක්‍රියාවට නැංවීම.

7.11. පාසල අයත් ප්‍රදේශයේ පොලිස් රථ වාහන අංශය සමග මනා සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම හා පාසල් අවට ප්‍රදේශය ආරක්ෂිත කලාපයක්( School Safety Zone) ලෙස පවත්වාගෙන යාම.

7.12. පාසල් මාර්ග ආරක්ෂණ වැඩපිළිවෙළ කාර්යක්ෂම ව හා ඵලදායී ව ඉටු කරන සාමාජිකයින් සඳහා පදක්කම්, සහතික, සම්මාන සහ උසස්වීම් ලබා දීමට කටයුතු කිරීම.
'පාසල් මාර්ග ආරක්ෂණ සමාජ මාර්ගෝපදේශ සංග්‍රහය' අනුව, එම සමාජයේ සාමාජිකයන්හට ජාතික මට්ටම දක්වා මෙමගින් පදක්කම් හා උසස්වීම් ලබා ගැනීමට අවස්ථාව හිමි වේ.

මාර්ග ආරක්ෂණ වැඩසටහන ජාතික වැදගත්කමක් සහිත ක්‍රියාවලියක් බැවින් ඉහත උපදෙස් අනුව පාසලේ මාර්ග ආරක්ෂණ කටයුතු සංවිධානාත්මක ව ඉටු කිරීමට සියලු ම විදුහල්පතිවරුන්ගේ වගකීම වේ.

තවද, සෑම පාසලක ම පාසල් මාර්ග ආරක්ෂණ සමාජ පිහිටුවා, එම වැඩසටහන් කාර්යක්ෂමව හා ඵලදායි අයුරින් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු බව මෙයින් අවධාරණය කරමි.

**වසන්තා පෙරේරා**
**ලේකම්**
**අධ්‍යාපන අමාත්‍යාංශය**

පිටපත් -

1. ලේකම්, ප්‍රවාහන හා මහාමාර්ග ආමාත්‍යාංශය - දැ.ගැ.පි. / අ.ක.ස.
2. පොලිස්පති, ශ්‍රී ලංකා පොලීසිය - දැ.ගැ.පි. / අ.ක.ස.
3. සභාපති, මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව - දැ.ගැ.පි. / අ.ක.ස.
4. සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන් - දැ.ගැ.පි. / අ.ක.ස.
5. සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - දැ.ගැ.පි. / අ.ක.ස.
6. සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - දැ.ගැ.පි. / අ.ක.ස.
7. සියලු ම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - දැ.ගැ.පි. / අ.ක.ස.
8. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - දැ.ගැ.පි. / අ.ක.ස.